International Federation
of Red Cross and Red Crescent Societies

ICRC

**ඒකාබද්ධ ප්‍රවෘත්ති නිවේදනය**

# ලෝක රතු කුරුස දිනය 2011
# ස්වේච්ඡා සේවය : මානුෂවාදී ක්‍රියාකලාපයේ ජීවගුණය

**2011 මැයි මස 6 දා කොළඹදී :** ජලගැල්මක්, නියගයක්, යුද්ධයක්, සාගතයක් , නායයාමක් එසේත් නැත්නම් ශ්‍රී ලංකාවේ හෝ හයිටියේ , පාකිස්ථානයේ, ලිබියාවේ, සිරියාවේ, ඊජිප්තුවේ, ජපානයේ මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදාවක් වැනි මානුෂවාදී අර්බුදවලදී ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ සහ ලොවපුරා රතු කුරුස සංවිධානයේ ස්වේච්ඡා සේවකයෝ විපතට පත්වූවන්ගේ පිහිටට ප්‍රථමයෙන් ඉදිරිපත්වී කටයුතු කරන පිරිස අතර වෙති..රෝගීන් සහ තුවාල ලැබූවන් බේරා ගැනීමේ සිට ප්‍රථමාධාර, ජලය, ආහාර ආදී විපතට පත්වූවන් ගේ අවශ්‍යතා සපුරාලන අපගේ ස්වේච්ඡා සේවකයෝ වසර 150 කට වැඩි කාලයක සිට ප්‍රජාව කෙරෙහි ප්‍රමුඛත්වය දී සේවා සලසමින් සිටිති.

මේ වසර අන්තර් ජාතික ස්වේච්ඡා සේවක වසරේ 10 වැනි සංවත්සරය මෙන්ම . ස්වේච්ඡා සේවයේ යුරෝපීය වසරද වෙයි. මෙය රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයට ලෝකයේ විශාලතම මානුෂවාදී සේවා ජාලය බවට පත්වීමට මග සලසමින් ස්වේච්ඡා සේවකයන් ඉටු ඉටුකර ඇති උදාර සේවාව ප්‍රවර්ධනය කිරීමට සහ එම සේවාව පිළිගැනීමට අවස්ථාවක් වෙයි. වර්තමානයේ සෑම පුද්ගලයින් දෙදෙහසකින් එක් අයෙක් රතු කුරුස ස්වේච්ඡා සේවකයෙක් වෙයි. මේ අනුව ලොව සෑම ප්‍රජාවකම පාහේ ස්වේච්ඡා සේවකයෙකු එම ප්‍රජාවගේ සේවය වෙනුවෙන් සිටින බව තහවුරුවෙයි. මෙය මහත් අභිමානයක් මෙන්ම සාඩම්බරයටද හේතුවකි.

දැනට ශ්‍රී ලංකාවේ 60000 ඉක්මවන සක්‍රිය ස්වේච්ඡා සේවකයන් සමූහය ආපදා අවස්ථාවලදී මෙරට ජනතාව උදෙසා සේවා සැලසීමට සිය වටිනා කාලය මිඩංගු කරති. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ 75 වසරක ඉතිහාසය තුළ එම සමාජය ජනතාව උදෙසා ඉටු කරන මෙහෙයෙහි මහා ශක්තිය වී සිටින්නේ ස්වේච්ඡා සේවකයෝය. ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ සභාපති ජගත් අබේසිංහ මහතා අදහස් දක්වමින් පැවසුවේ “ස්වේච්ඡා සේවකයන් ඉටු කරන සේවාව මෙතෙකැයි කියා නිම කරන්න නොහැකියි. ශ්‍රී ලංකාවේ ආපදාවක් හටගත් සෑම අවස්ථාවකම දැඩි ලෙස පීඩාවට පත් ජනතාවට ආධාර උපකාර කිරීමේදී අප සැමවිටම විශ්වාසය තබා ක්‍රියා කරන්නෙ ස්වේච්ඡා සේවකත් කෙරෙහිය. ලෝක රතු කුරුස දිනයේදී අප ඔවුන් එසේ ඉටු කරන අගනා සේවාව පිළිගැනීමට පාත්‍ර කර ඔවුන්ට ස්තුතිය පළ කළ යුතුයි.” යනුවෙනි.

රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සම්මේලනයේ ශ්‍රී ලංකාවේ දූත පිරිසේ ප්‍රධානි බොබ් මැක්කෙරෝ මහතා පවසන්නේ “ ස්වේච්ඡා සේවකයන් තමන් විපතකදී ප්‍රතිචාර දක්වමින් ප්‍රජාවට ආධාර උපකාර කරන පිරිසක් වුවත් බොහෝ විට ඔවුන් ද එම විපතින් පීඩාවට පත්වූවන් වීම මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වැදගත් කරුණකි .එහෙත් ඔවුන් තුළ පවතින ධෛර්යය සහ සහයෝගිතාවයේ හැඟීම නිසා ඔව්හු තම පෞද්ගලික දුක් පීඩා පසෙකලා අන්‍යයන්ගේ යහපත වෙනුවෙන් සේවා සැලසීම ඉතා උසස් ගුණාංගයකි. ස්වේච්ඡා සේවකයන් සැමවිටම විපතේදී සිය අසල්වැසියන් ගේ පිළිසරණට හනික ඉදිරිපත්වී ඔවුන් පත්ව සිටින තත්වය යහපත් අතට පත් කිරීමට වෙරදරති.”

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ශ්‍රී ලංකාවේ දූත පිරිසේ ප්‍රධානී යෙවෙස් ජියෝවන්නෝනි මහතා “ ස්වාභාවිකව සිදුවන හෝ මිනිසා විසින් ඇති කරන ලද ආපදාවලදී සහ ඉන් පසුව රතු කුරුස සංවිධානය ඉටු කරන මානුෂවාදී මෙහෙවරෙහි ප්‍රාණනාලිය ස්වේච්ඡා සේවකයෝය. ශ්‍රී ලංකාවේ සන්නද්ධ ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස පැනනැගුණු සහ සක්‍රිය එදිරිවාදිකම් නිමවීමෙන් පසුව තවමත් ඉතිරිව පවතින මානුෂවාදී අවශ්‍යතා සපුරාලීමට හැකිවන පරිදි ජාතික සමාජය සමඟ සහයෝගිතාව ඉහළ නංවමින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ජාතික සමාජය සහ එහි ස්වේච්ඡා සේවකයන් සතු හැකියාව වර්ධනය කරගැනීමට ආධාර කරයි.” යනුවෙන් පැවසීය.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ අපි රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සම්මේලනය, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානය සමග එක්ව ස්වේච්ඡා සේවකයන් ගේ වැදගත්කම අවධාරණය කරමු. ඔව්හු හදිසි අවස්ථාවලදී පමණක් ප්‍රතිචාර දැක්වීමට සීමා වූ පිරිසක් නොවෙති. දිනපතා ඔව්හු නිහඬව ප්‍රජාව සමග එකතුව ලොවපුරා වැඩ කරති. රතු කුරුස සංවිධානය වශයෙන් අප ගේ බැඳීම වන්නේ නිරතුරුව මහත් පෞද්ගලික කැපකිරීම් සමඟ ස්වේච්ඡා සේවකයන් ඉටු කරන උදාර කාර්ය භාරය වඩාත් උසස් අන්දමින් ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ පිළිගැනීමට පාත්‍ර කිරීමට රජය සහ හවුල්කරුවන් සමඟ වැඩකිරීමයි.

ඔබගේ ප්‍රජාවේ සිටින ස්වේච්ඡා සේවකයන්ට තුති පිදීමට සහ සෑම ආකාරයකම ස්වේච්ඡා සේවය අගය කරන බව පෙන්වීමට මැයි 8 දා අප හා එක්වන්න.

වැඩි විස්තර ලබා ගැනීමට සහ සම්මුඛ සාකච්ඡා සංවිධානය කර ගැනීමට කරුණාකර අමතන්න

*Mahieash Johnney – Communications & Reporting Manager at IFRC – 0773502156*
*Sarasi Wijeratne – Information Officer, ICRC - 0773158844*

The Red Cross Movement in Sri Lanka promotes the humanitarian activities across 26 branches in the island by coordinating disaster relief and encouraging development support, while seeking to prevent and alleviate human suffering. The International Federation, its 186 National Societies and the International Committee of the Red Cross together constitute the International Red Cross and Red Crescent Movement.